| Class | 373.13072 |
| --- | --- |
| No | B17 |

# පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි අභ්‍යන්තර අධීක්ෂණය පිළිබඳ අධ්‍යයනයක්

OUSL Library.
Donated by.
Dr. W. M. S.
Wanasinghe

බී. එම්. කුමුදු කුමාරි බස්නායක

ලියාපදිංචි අංකය : 713297593

වාණිජවේදී (විශේෂ) උපාධිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 1997

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන සාමාර්ථ)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2010

OPEN UNIVERSITY
74472

අධ්‍යාපනපති උපාධි පාඨමාලාවේ (2013/14) අවශ්‍යතා පූරණය සඳහා

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කෙරෙන ස්වාධීන

පර්යේෂණ නිබන්ධනය

2019 ඔක්තොම්බර්

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

# සංක්ෂිප්තය

මෙම පර්යේෂණ නිබන්ධනය වර්තමාන පාසල්වල පන්තිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ අභ්‍යන්තර අධීක්ෂණය සිදුවන ආකාරය විමසා බැලීම සඳහා වූ අධ්‍යයනයකි. අධ්‍යයනයෙහි සුවිශේෂී අරමුණු වූ යේ පන්තිකාමර අභ්‍යන්තර අධීක්ෂණය සිදුවන ආකාරය විමසා බැලීම, පන්තිකාමර අභ්‍යන්තර අධීක්ෂණය පිළිබඳ අභ්‍යන්තර අධීක්ෂකයින්ගේ සංජානන හඳුනාගැනීම, පන්තිකාමර අභ්‍යන්තර අධීක්ෂණය පිළිබඳ අධීක්ෂිතයින්ගේ සංජානන හඳුනාගැනීම, පන්තිකාමර අභ්‍යන්තර අධීක්ෂණයේ ප්‍රබලතා සහ දුබලතා අනාවරණය කර ගැනීම සහ පන්තිකාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ අභ්‍යන්තර අධීක්ෂණය වැඩි දියුණු කිරීමට ප්‍රතිචාර දෙන්නන්ගේ අදහස් සහ යෝජනා විමසා බැලීමත් ය. පර්යේෂණ අධ්‍යයනය මෙහෙයවීමේ දී විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශයට අයත් නියැදි සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය උපයෝගී කරගත් අතර අධ්‍යයනයෙහි සමස්ත ජනගහනය වූ යේ බොරුල්ල අධ්‍යාපන කොට්ඨාශයට අයත් පාසල් 24 කි. අධ්‍යයන නියැදිය සඳහා ගුරුභවතුන්, විදුහල්පතිවරු, නියෝජ්‍ය විදුහල්පතිවරු සහ අංශ/විෂයය ප්‍රධානීන් ඇතුළත් විණි. අහඹු ස්ථරායන නියැදිය ලෙස පාසල් 07 ක් ඉහත දැක් වූ පාසල් අතරින් තෝරාගත් අතර එම පාසල්වල පාසල් වර්ගීකරණයට අනුව ප්‍රතිචාර දෙන්නන් 50 දෙනෙකු අහඹු ස්ථරායන නියැදීම පදනම් කරගෙන නියැදිය වශයෙන් තෝරාගන්නා ලදී. දත්ත රැස්කිරීම සඳහා ප්‍රධාන පර්යේෂණ උපකරණ ලෙස ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා භාවිතා කළ අතර මීට අමතර ව වාර්තා විශ්ලේෂණය නැමැති ක්‍රම ශිල්පය ද භාවිතා කරන ලදී. අධ්‍යයනයෙහි මූලික අනාවරණයන් වූ යේ අභ්‍යන්තර අධීක්ෂකයින් සහ අධීක්ෂිතයින් යන දෙපාර්ශවය ම විධිමත් ව සැලසුම් කරන ලද අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියක අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණත් වර්තමාන අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය මෙම අපේක්ෂිත මට්ටමට වඩා පහළ තත්ත්වයක පවතින බව ය. අධීක්ෂණයේ දී ගුරුභවතුන්ගේ ස්වාධීනත්වයට සහ පෞද්ගලිකත්වයට අධීක්ෂකයින් ගරු කළ යුතු බව අභ්‍යන්තර අධීක්ෂකයින්ගේ අදහස වූ අතර අභ්‍යන්තර අධීක්ෂණය, ප්‍රජාතන්ත්‍රවාදී සහ අපක්ෂපාතී ව ක්‍රියාත්මක කළ යුතු බව අධීක්ෂිතයින්ගේ මතය විණි. සුදුසුකම් සහිත, අත්දැකීම් බහුල ප්‍රවීනයන් මගින් අභ්‍යන්තර අධීක්ෂණය සිදු කරනු දැකීමට ගුරුවරුන් කැමැති බවත්, මිනිත්තු 40 ක් වූ මුළු කාලපරිච්ඡේදය ම පන්තිකාමරය තුළ රැඳෙමින් අධීක්ෂණය නොකිරීම දුබලතාවයක් ලෙස ද අනාවරණය විණි. අධ්‍යයනයෙහි ප්‍රධාන යෝජනා ලෙස, අධීක්ෂණ කාර්යයේ නියැලීමට පළමු ව අභ්‍යන්තර අධීක්ෂකයින් පුහුණුවකට ලක් විය යුතු බව සහ හැකි සෑම අවස්ථාවක දී ම විවිධ විෂයයන් ට අදාළ විෂයය ප්‍රවීනයන් මගින් අධීක්ෂණය සිදු කළ යුතු බව අනාවරණය විණි.

## Abstract

This research was conducted in order to findout the way the internal supervision is conducted in teaching - learning process in schools at present. The main objectives of the study were to findout how the classroom internal supervision is conducted, the perception of the supervisors and Supervisees on the mannaer internal supervision is conducted ,finding out the strengths and weaknesses of the internal supervision and gain opinions and suggestions from the respondants to enhance the process of internal supervision in schools. The survey research is conducted under the descriptive research approach, while the targeted population of the study was twenty four schools in Borella educational division. The sample is consisted of teachers, principals, deputy principals and the sectional /subject heads. Seven schools and fifty respondants were selected on the random basis. Data collection was done by the questionarias and Interview schedules. In addition to that perusal of documents were considered. The main finding of the study revealed that both the superviors and the supervisees have identified the necessity of a wellplanned internal supervision programme but the present programme fails far below the expectation. The internal supervisors pointed out the opinion that the independancy and the privacy of the teachers should be respected by the supervisors and also the supervisees acknowledged that it should be done in a democratic and unbiased manner. Teachers welcomed supervision by qualified and experienced person but they point out that it is a weakness that they are not remaining in the classroom in 40 minutes period. Main suggestions of the study were that internal supervisors should be provided with good training programme before they are engaged for the supervision and they also claim that the supervision should be conducted by the subject experts of the relevant subject.